

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සීමා නිර්ණය කොමිෂන් සභාව

වැය ශීර්ෂය - 025

2022 ஆம் ஆண்டிற்கான செயலாற்றுகை அறிக்கை

எல்லை நிர்ணய ஆணைக்குழு

செலவுத் தலைப்பு - 025

Annual Performance Report for the year 2022

Delimitation Commission

Expenditure Head No - 025



2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සීමා නිර්ණය කොමිෂන් සභාව

වැය ශීර්ෂය - 025

අන්තර්ගතය

1.	ආයතනික පැතිකඩ	1
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	5
3.	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	8
4.	කාර්ය සාධන දර්ශක	20
5.	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	21
6.	මානව සම්පත් පැතිකඩ	21
7.	අනුකූලතා වාර්තාව	23
8.	කෘතඥතා	28

1. ආයතනික පැතිකඩ

1.1 හැදින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව අනුව,අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2020.12.07 වන දින සිට වසරක කාලයක් නව සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කරන ලද අතර, එහි සභාපති හා සාමාජික ලෙස මහින්ද දේශප්‍රිය මහතා ද, සෙසු සාමාජිකයන් දෙදෙනෝ ලෙස ජයලත් රවි දිසානායක මහතා සහ පී.එච්.ජී.ප්‍රේමසිරි මහතා මහතා ද පත් කරන ලදී. එම වසරක කාලය අවසානයේ දී එම කොමිෂන් සභාවම අතිගරු ජනාධිපතිතුමා විසින් 2021.12.07 දින සිට වසරක කාලයක් සඳහා නැවත පත් කරන ලදී.

සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය, සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ, දෙවන මහලේ ස්ථාපිත කර ඇති අතර, එහි ලිපිනයසීමා නිර්ණය කොමිෂන් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල, තැ.පෙ.506, කොළඹ-05 වේ.

සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කිරීම, බලතල හා කාර්ය භාරය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාවට අනුව උක්ත ප්‍රතිපාදන මෙසේය.*

41 ආ

(1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තෙකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, නොකරනු ලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3)මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එලඹෙන කවර හෝ විටෙක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශ වලින් ලිංගික වර්ගීකරණය ඇතුළුව ශ්‍රී ලාංකිය සමාජයේ බහුත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තැනැත්තන් තිදෙනකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර , නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුලත ජනාධිපතිවරයා විසින්, මෙම ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේය. එකී දින දහහතරක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වූ විටෙක , එකී කාලපරිච්ඡේදය අවසන් වන දින සිට බල පැවැත්වෙන පරිදි

(අ) කොමිෂන් සභාවක සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනු ව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේය, සහ

(ආ) කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනු ව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ නම් සඳහන් ලැයිස්තුවේ පළමුව නම දැක්වෙන තැනැත්තා අදාළ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තෙකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයෙකුගේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවකදී ඒ තැනැත්තා සභාවේ පුර්ව අනුමැතිය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේය.

(6) මැතිවරණ කොමිෂන් සභාව හැර මේ අවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේය. පිළිතුරු දිමට බැඳී සිටිය යුත්තේය.

උප ලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාෙ

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ කොමිෂන් සභාව

(ඊ) මුදල් කොමිෂන් සභාව

(උ) සීමා නිර්ණය කොමිෂන් සභාව

95

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරිම ආරම්භ වීමෙන් පසුව මාස තුනක් ඇතුළත , මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරිම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දේශපාලන කටයුතු වල නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන් දෙනෙකුගෙන් ඒ කොමිෂන් සභාව සමන්විත විය යුත්තේ ය.ඔවුන් අතුරෙන් එක් තැනැත්තෙකු එම කොමිෂන් සභාවේ සභාපතිධුරයට ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය.

(2) සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් කිසි සාමාජිකයෙකු මිය ගියහොත් නැත්නම් ඉල්ලා අස්වුව හොත්, එසේත් නැත්නම් යම් කිසි සාමාජිකයෙකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් සිය කාර්තව්‍යය යථා පරිදි ඉටුකළ නොහැකි යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කළ යුත්තේය.

96.

(1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව විස්සකට අඩු නොවූ ද විසි පහකට වැඩි නොවුද , මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒ එක් එක් කොට්ඨාසය ට නමක් දිය යුත්තේය.

(2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සැලකිය හැක්කේය. නැතහොත් ඒ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාස දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට බෙදිය හැක්කේය.

(3) පළාතක් මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදනු ලබන අවස්ථාවකදී, හැකිතාක් දුරට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවක් හෝ වන බවට නැතහොත් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සමන්විත වන බවට වග බලාගනු පිණිස, සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් , එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේය.

(4) එක් එක් පළාතේ මැතිවරණ කොට්ඨාස වලට (ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයේ නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරාපත් කිරීමට හිමිකම ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට අමතරව) මන්ත්‍රීවරයන් සිව් දෙනෙකු තෝරාපත් කිරීමට හිමිකම ඇත්තේය. එම හිමිකම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් එම මැතිවරණ කොට්ඨාස අතර සාධාරණව බෙදිය යුත්තේය.

(5) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මත භේදයක් ඇතිවුවහොත් ඒ සාමාජිකයන් අතරෙන් වැඩි දෙනාගේ මතය බල පැවැත්විය යුතු අතර , එය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් සියලු දෙනාම එකකට එකක් වෙනස් මත දරන්නේ නම් , කොමිෂන් සභාවේ සභාපතිවරයා ගේ මතය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයිනම් ඔහු එකඟ නොවීමට හේතු දැක්විය හැක්කේය.

(6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද , ඒ තීරණය ට එකඟ නොවන සාමාජිකයෙකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයාට දැන්විය යුත්තේය.

*2022.10.21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2022.10.31 දින සිට බලාත්මක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් මෙම ප්‍රතිපාදනය සංශෝධනය කර ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

සදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය ලබා ගැනීම.

මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස , සදාචාරාත්මක ලෙස , සාධාරණ ලෙස , කාර්යක්ෂමව , පාරදෘෂ්‍යභාවයෙන් යුතුව විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

අරමුණු

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම සමාන ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරීම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරීම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරීමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරීම.

- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දීම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- නිදහස්, සාධාරණ හා විශ්වසනීය ඡන්ද විමසීම් සඳහා නියමානුකූල, නිවැරදි, සාධාරණ සීමා නිර්ණය ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය බව පුරවැසියන්, දේශපාලන පක්ෂ ඇතුළු සියළු පාර්ශවයන් දැනුම්වත් කිරීම.


1.3 ප්‍රධාන කාර්යභාරය හා බලතල

සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කිරීම හා එහි ප්‍රධාන කාර්ය නියමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථාවන් මඟින් සිදු කෙරේ. එහෙත් මෙම කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ දහනව වන සංශෝධනයේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යභාරය(Functions)
- කොමිෂන් සභාවේ බලතල (Powers)

තවද වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සීමා නිර්ණය කොමිෂන් සභාවට වගකීම් පැවරීමක්ද (Mandate) සිදුකොට නොමැත. ස්ථිරභාර කාර්යයන් ආරම්භ කිරීම සඳහා තමන්ට වගකීම් පැවරෙන පාර්ලිමේන්තු අනපනත් සකස්වනු ඇතැයි සීමා නිර්ණය කොමිෂන් සභාව අපේක්ෂාවෙන් සිටින්නීය.

1.4 සංවිධාන සටහන



කළමනාකරණ සේවා නිලධාරී	01

භාෂා පරිවර්තක (පුරප්පාඩු)	03
කළමනාකරණ සේවා නිලධාරී	01
තොරතුරු තාක්ෂණ නිලධාරී(පුරප්පාඩු)	02
රියැදුරු	02
කාර්යාල කාර්ය සහායක	02

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 රැස්වීම්

මෙම වර්ෂය තුළ පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් 1**3** ක් පැවැත්විය.

රැස්වීම් වාරය	***දිනය***	***රැස්වීම් වාරය***	***දිනය***
20වන රැස්වීම	2022.01.05	**27** වන රැස්වීම	2022.07.27
21 වන රැස්වීම	2022.02.07	**28** වන රැස්වීම	2022.08.25
22 වන රැස්වීම	2022.02.28	**29** වන රැස්වීම	2022.09.22
23 වන රැස්වීම	2022.03.22	**30** වන රැස්වීම	2022.10.20
24 වන රැස්වීම	2022.04.05	**31** වන රැස්වීම	2022.11.30
25 වන රැස්වීම	2022.05.26	**32** වන රැස්වීම	2022.12.13
26 වන රැස්වීම	2022.06.29		

2.2 ආයතනික කටයුතු

කොමිෂන් සභාවේ සියලුම නිලධාරින්ගේ ආයතනික කටයුතු වලට අදාලව නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම ඇතුළු සියලුම ආයතනික කටයුතු සිදු කිරීම, කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ආයතනික කටයුතු ඉටු කිරීම,කොමිෂන් සභාව සතු මෝටර් රථ 02 ට අදාල ලිපිගොනු කටයුතු සිදු කිරීම, ඉන්ධන අත්තිකාරම් ලේඛනය පවත්වාගෙන යාම, නිවාඩු ලිපිලේඛන පවත්වාගෙන යාම හා කාර්යාල උපකරණ අළුත්වැඩියාවට අදාල ලේඛන පවත්වාගෙන යාම සිදු කරයි.

මීට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලය, පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තු සභාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ වාර්තා ඉදිරිපත් කල යුතු වෙනත් ආයතන වෙත ලබාදිය යුතු වාර්තා නියමිත දිනට ලබා දීම සිදු කරයි.

2.3 මූල්‍ය පරිපාලනය

සියලුම ගෙවීම් කටයුතු නිසි නිර්දේශයකින් හා අනුමැතියකින් යුතුව මුදල් රෙගුලාසි අනුව නිසි පරිදි සිදු කල අතර ප්‍රසම්පාදන කටයුතුද, භාණ්ඩ සමීක්ෂණ කටයුතුද නිසියාකාරයෙන් ක්‍රියාත්මක කර ඇත. මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලා ඇති සියලුම වාර්තා හා තොරතුරු නිසි අයුරින් ලබා දීමද සිදු කර ඇත.

තවද ජාතික විගණන කොමිෂන් සභාව විසින් ඉල්ලා ඇති වාර්තා නියමිත පරිදි ලබා දීමට කටයුතු කර ඇති අතර විගණන විමසුම් වලටද නිසි පරිදි පිළිතුරු සපයා ඇත.

2.4 සීමා නිර්ණය හා ඊට අදාළ ගැටළු පිළිබඳව මහජනතාව හා නිලධාරීන් දැනුවත් කිරීම.

2.4.1 සීමා නිර්ණ ගැටළු අධ්‍යයනය කොට විසඳුම් යෝජනා සහිත වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්ද සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත බලතල පවරා නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා දැනුම්වත් කිරීම සඳහා සාකච්ඡාවක් ලබා ගැනීමට කටයුතු කළ අතර, එම සාකච්ඡාව 2021.03.25 දින අතිගරු ජනාධිපතිතුමා සමඟ සිදු කරන ලදී.සීමා නිර්ණය පිළිබඳ පොදුවේ දැකිය හැකි ගැටළු සහගත තත්ත්වය නිසා ජනතාවටත්, ආණ්ඩුවටත් සිදුවන අපහසුතා ගැන අතිගරු ජනාධිපතිතුමා කොමිෂන් සභාව සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. අනතුරුව මෙම ගැටළු සහ ඒ සඳහා විසඳුම් හඳුනාගෙන වාර්තා කරන මෙන් අතිගරු ජනාධිපතිතුමා කොමිෂන් සභාවට උපදෙස් දෙන ලදී. ඒ අනුව, ජනාධිපති ලේකම්වරයා PS/CAS/00/12/DC/02 හා 2021.03.29 දිනැති ලිපියෙන් සාමාන්‍ය ජන ජීවිතය ඵලදායී ලෙස පවත්වා ගැනීමට ඇති වී තිබෙන බාධා හා දුෂ්කරතා කෙරෙහි ද ප්‍රමුඛ අවධානයක් යොමු කරමින් ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පැන නැඟී ඇති සීමා නිර්ණ ගැටළු අධ්‍යයනය කොට විසඳුම් යෝජනා සහිත වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් සිදු කරන ලද දැනුම්දීම අනුව, ඒ සම්බන්ධ මූලික වාර්තාවක් සකස් කර 2021.11.02 දින අතිගරු ජනාධිපතිතුමා වෙත යැවීමෙන් අනතුරුව, 2022 වර්ෂයේ දී ද එම කාර්යය, අඛණ්ඩව සිදු කරන ලදී. 2022 වර්ෂයේ මාර්තු මාසයේ දී රටේ ඇති වූ අර්බුදකාරී තත්ත්වය මත එකී කාර්යය ඉටු කිරීමට බරපතල ලෙස බාධා ඇති වූ අතර, 2022 අගෝස්තු මස සිට වත්මන් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව එකී කාර්යය සිදු කෙරෙමින් පවතී.

2.4.2 2021 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස බෙදා වෙන් කිරීමේ කාර්යය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ සහය ලබා ගන්නා ලෙස කරන ලද ඉල්ලීම නොසලකා හරිමින්, එම කාර්යය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ කමිටුවක් මඟින් සිදු කරවා ගැනීමෙන් අනතුරුව ඒ හා සබැඳිව සිදු කළ යුතු පළාත්පාලන ආයතනවල ඡන්ද කොට්ඨාස මායිම් වෙනස් කිරීම සඳහා තවත් කමිටුවක් පත් කිරීමට විෂය භාර අමාත්‍යවරයා විසින් 2022 මාර්තු මස ක්‍රියා කර තිබිණි. මේ සම්බන්ධයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවේ අසතුට, සෘජුවම සභාපතිවරයා විසින් ගරු ජනාධිපතිතුමා වෙත ප්‍රකාශ කරන ලදුව, සීමා නිර්ණය කොමිෂන් සභාවේ නියෝජනයක් නොමැතිව එවැනි කමිටුවක් ක්‍රියාත්මක කිරීම අනවශ්‍ය බවට ගරු ජනාධිපතිතුමා එකඟතාව ප්‍රකාශ කරන ලදී.

2.4.3 2022 සැප්තැම්බර් මස ගරු ජනාධිපතිතුමා විසින් පළාත්පාලන ආයතන කිහිපයක් මහ නගර සභා තත්ත්වයට උසස් කිරීම සඳහා කරනු ලැබූ යෝජනාව අනුව, නගර කිහිපයක් මහ නගර සභා තත්ත්වයට උසස් කර සීමා මායිම් නියම කර ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමට යෝජිත බව නිරීක්ෂණය වූ හෙයින්, එම කාර්යය ව්‍යවස්ථාපිත සීමා නිර්ණය කොමිෂන් සභාව තුළින් සිදු කර ගන්නා ලෙස ජනාධිපති ලේකම්වරයා වෙත කරන ලද ඉල්ලීම, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශය විසින් නොසලකා හරිමින් පස් දෙනෙකු ගෙන් යුතු කමිටුවක් මඟින් එම කාර්යය එම කාර්යය ඉටු කරවා ගෙන තිබීම. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමේ කාර්යයක් හෙයින්, මේ පිළිබඳව ද සීමා නිර්ණය කොමිෂන් සභාවේ දැඩි අප්‍රසාදය හා විරෝධය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2022 ඔක්තෝබර් 19 දින ලිඛිතව දන්වන ලදී. එමෙන් ම ඒ බව , පළාත්පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරිණියට ද දන්වන ලදී. මේ පිළිබඳව ජනාධිපති ලේකම්වරයා ද, අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා ද දැනුම්වත් කරන ලද අතර, ගරු ජනාධිපතිතුමා වෙත ද මේ සම්බන්ධයෙන් වාර්තා කරන ලදී.

2.4.4 2022 සැප්තැම්බර් / නොවැම්බර් කාසල සීමාව තුළ දී පළාත්පාලන ආයතනවල සභික සංඛ්‍යාව 8800 සිට 4000 දක්වා අඩු කිරීම පිළිබඳව යෝජනාවක් ගරු ජනාධිපතිතුමා ඡනගත කර තිබූ හෙයින්, එසේ කරන්නේ නම් නව සීමා නිර්ණයක් සිදු කළ යුතු බැවින් ඒ වෙනුවෙන් පළාත්පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පස්දෙනෙකුගෙන් යුතු ජාතික කමිටුව සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් පත් කිරීමට පියවර ගන්නා ලෙස සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ජනාධිපති ලේකම්වරයා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා දැනුම්වත් කරන ලදී.

2.4.5 එම ඉල්ලීමට, විෂය භාර අමාත්‍යවරයා වූ ගරු අග්‍රාමාත්‍යතුමා එකඟතාව දැක් වූ හෙයින්, එකී ජාතික කමිටුවට සීමා නිර්ණය කොමිෂන් සභාවේ විදේශ ගතව සිටි සාමාජිකයා හැර අනෙකුත් සාමාජියින් දෙදෙනෝ සමඟ තවත් තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් විෂය භාර අමාත්‍යවරයා විසින් 2022.11.01 දින සිට 2023.02.28 දින දක්වා කාලය සඳහා පත් කරන ලදී. එම කමිටුව පහත දැක්වෙන පරිදිය .

1. මහින්ද දේශප්‍රිය මහතා - (සභාපති)
2. ජයලත් ර.වි.දිසානායක මහතා - (සාමාජික)
3. ඩබ්.එම්.එම්.ආර්.අදිකාරි මහත්මිය - (සාමාජික)
4. ආචාර්ය කේ.තවලිංගම් මහතා - (සාමාජික)
5. අයි.ඒ.හමීඩ් මහතා - (සාමාජික)

2.4.6 සීමා නිර්ණය කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය ම 2022.11.04 දින සිට එම ජාතික කමිටුවේ කාර්යයන් සඳහා නිරත කරවනු ලැබිණ. ජාතික කමිටුවේ ආයතනික හා මූල්‍ය පරිපාලන කටයුතු ද සිදු කරනු ලැබුවේ සීමා නිර්ණය කොමිෂන් සභාව හරහා ය.

2.5 සම්පත් කේන්ද්‍රය

සීමා නිර්ණය විෂයට අදාල වන මුද්‍රිත හා විද්‍යුත් ලිපි ලේඛනයන් ඒකතුව පුළුල් කිරීමේ ක්‍රියාවලියෙහි කොමිෂන් සභාව අඛණ්ඩව නිරතව සිටී. සීමා නිර්ණයට අදාල ගැසට් නිවේදන, වාර්තා හා වෙනත් ලිපි ලේඛණ පිටපත් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස තුළ සිතියම් ඉල්ලා සිටින පාර්ශවයනට ලබා දීමට ද කොමිෂන් සභාව සූදානම්ව සිටී.

2.6 සීමා නිර්ණය හා ඊට අදාල ගැටළු පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම.

- 2022 මාර්තු මාසයේ සිට දිවයිනේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය, ඉන්ධන හිඟය හා උද්ඝෝෂණ හේතුවෙන් යෝජිතව තිබූ පරිදි දැනුම්වත් කිරීම් සිදු කළ නොහැකි වූ නමුත්, මතු සඳහන් පරිදි එකී වැඩ සටහන් සිදු කර තිබේ.

- සීමා නිර්ණය පිළිබඳව බදුල්ල දිස්ත්‍රික්කයේ මාණ්ඩලික නිලධාරි එකමුතුව දැනුම්වත් කිරීම - (ඇල්ල ප්‍රාදේශීය ලේකම්වරයාගේ මූලිකත්වයෙනි.)

- මැතිවරණ වෘත්තීයවේදීන්ගේ සංගමයේ නිලධාරීන් දැනුම්වත් කිරීම. – 2022 මාර්තු

- 2022 මැයි, ජුනි කාල සීමාව තුළ වයඹ හා කොළඹ විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන් දැනුම්වත් කිරීම - Zoom තාක්ෂණය ඔස්සේ
- ෆෙඩරල් සංවිධානයේ මූලිකත්වයෙන් පැවති පළාත්පාලන ආයතන කාන්තා නියෝජිතයින් දැනුම්වත් කිරීමේ වැඩ සටහන
- කෑගල්ල, කැළණිය, රත්ගම, මාදම්පාගම, ජාතික පාසැල්වල ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයින් දැනුම්වත් කිරීම.
- කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන.
- සබරගමුව විශ්ව විද්‍යාලයේ නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන.
- භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සමඟ එක්ව කටයුතු කිරීම සහ අන්තර් ජාතික මව් භාෂා දිනය සැමරීම.
- වවුනියාව AFRIELසංවිධානයේ වැඩ සටහනක් හරහා දෙමළ මාධ්‍ය තරුණ තරුණියන් දැනුම්වත් කිරීම.
- ලංකා ගුරු සංගමයේ දිස්ත්‍රික් නියෝජිතයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන.
- 2022 නොවැම්බර් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩ සටහන
- 2022 දෙසැම්බර් දේශපාලන පක්ෂ දැනුම්වත් කිරීමේ වැඩ සටහන
- 2022 දෙසැම්බර් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහන
- මෙයට අමතරව, රූපවාහිනී සාකච්ඡා, යූ ටියුබ් වැඩසටහන් හා පුවත්පත් සම්මුඛ සාකච්ඡා මඟින්, සීමා නිර්ණය පිළිබඳ විශේෂයෙන් ම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහා විධිමත් සීමා නිර්ණවල අවශ්‍යතාව පිළිබඳ පුරවැසියන් දැනුම්වත් කරන ලදී.

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එෆ්සිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කණ්ඩායම 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෆ්සිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		13,727,000	10,744,000	එෆ්සිඒ-3
-	තැන්පතු		3,225	3,125	එෆ්සිඒ-4
150,000	අත්තිකාරම් ගිණුම්		249,758	491,829	එෆ්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**13,979,983**	11,238,954	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**13,979,983**	11,238,954	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		70,189	22,719.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		13,909,794	11,216,235	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
9,890,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	9,975,485	8,729,753	
4,920,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	4,106,567	2,399,979	එෆ්සිඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
14,810,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**14,082,052**	11,129,732	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
-	වැඩිදියුණු කිරීම්	10	-	-	
25,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	17,500	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එෆ්සිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
50,000	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
75,000	මුළු මූලධන වියදම් (උ)		**17,500**	-	
	තැන්පතු ගෙවීම්		3,225	3,125	එෆ්සිඒ-4
500,000	අත්තිකාරම් ගෙවීම්		281,090	643,062	එෆ්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		284,315	646,187	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		14,383,867	11,775,919	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(474,073)	(559,684)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(474,073)	(559,684)	එෆ්සිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				එෆ්සිඒ-3
			(474,073)	(559,684)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
		නක්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,421,393	2,403,893
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	1,062,122	1,030,790
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	0
මුළු වත්කම්		**3,483,515**	**3,434,683**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,062,122	1,030,790
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,421,393	2,403,893
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	0	0
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	0
මුළු වගකීම්		**3,483,515**	**3,434,683**

පිටු අංක ...07...සිට ...24... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...25.... සිට ...31..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :ඒ. මුතුමාල
තනතුර :ලේකම්
දිනය : 2023.02.27
ඒ. මුතුමාල
ලේකම් (වැ.බ)
සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල
කොළඹ - 05

.....
ගණන්දීමේ නිලධාරි
නම :ඊ. ජී. එස්. සිසිරකුමාර
තනතුර :ගණකාධිකාරී
දිනය : 2023.02.27
ඊ.ජී.එස්. සිසිර කුමාර
ගණකාධිකාරී
සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල
කොළඹ - 05

3.3මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2022 රු.	**2021** රු.
මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	245,693	289,197
අග්‍රිම ලැබීම්	13,727,000	10,744,000
අත්තිකාරම් අයකර ගැනීම්	249,758	212,154
තැන්පතු ලැබීම්	3,225	3,125
මුදල් ප්‍රවාහය (අ)	**14,225,676**	**11,248,476**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	14,056,552	11,123,332
[illegible]	-	-
වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	70,189	22,719
අත්තිකාරම් ගෙවීම්	78,210	99,300
තැන්පතු ගෙවීම්	3,225	3,125
ලද මුදල් ප්‍රවාහය (ආ)	**14,208,176**	**11,248,476**
ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,500**	**-**
මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
[illegible] ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
	-	-
උපණය අයකර ගැනීම්	-	-
මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල්වලදී [illegible] හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	17,500	-
ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**17,500**	**-**
ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(17,500)**	**-**
ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**0**	**-**
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට නහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ''වාර්තාකරණ පදනම'' යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන(රු.)		
පුනරාවර්තන	14,810,000.00	15,910,000.00	14,082,052.00	88.51%
ප්‍රාග්ධන	75,000.00	75,000.00	17,500.00	23.33%

3.7 මු.රෙ **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම කොමිෂන් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**2022.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	**2022.12.31** දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත (රු.)	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	2421392.70	2421392.70	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/DC/2/22/25

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 31 දින.

DELIMITATION COMMISSION
09 JUN 2023
COLOMBO - 05

DN

ලේකම්,
සීමා නිර්ණය කොමිෂන් සභාව.

ශීර්ෂය - 025 සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
පොල්දූව පාර, බත්තරමුල්ල

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } PIC/B/DC/2/22/25 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 31 දින.

ලේකම්,
සීමා නිර්ණය කොමිෂන් සභාව.

ශීර්ෂය 025 - සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 025 - සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.2 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 03 ක් සඳහා රු.50,000 ක්, රු.48,000 ක් සහ රු.52,000 ක් බැගින් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර එම වැය විෂයයන්ගේ එකතුව රු.150,000 ක්වූ සම්පූර්ණ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයන් 02 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.950,000 ක් වෙන් කරගෙන තිබුණු අතර එම වැය විෂයන්ගේ ඉතිරිය රු.279,127 ක් හෙවත් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් විය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය	සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 262(2)	ගෙවනු ලැබූ සියළුම වවුචර්වල හා ගෙවීම් තහවුරු කෙරෙන ලේඛණවල "ගෙවන ලදී" මුද්‍රාව සටහන් කර නොතිබුණි.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කොමිෂන් සභාවේ කාර්යභාරය හා බලතල සම්බන්ධයෙන් පැහැදිළි කර නොතිබුණද කොමිෂන් සභාව වෙත විසර්ජන පනතින් 2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 14.22 ක් හා රු. මිලියන 15.98 ක් වෙන් කරදී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.මිලියන 11.13 ක් හා රු. මිලියන 14.10ක් වැය කර තිබුණි.

3.2 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ එක් කාර්යයක් ලෙස කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීමට සැලසුම් කර තිබුණද එම පුහුණු වැඩසටහන් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර පුහුණු වැඩසටහන් ගණනද සැලසුමෙහි දක්වා නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් 2017 හා 2018 වර්ෂවලදී අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් ඉදිරිපත් කර තිබුණද විගණිත දිනය දක්වාම පනත පිළියෙල කිරීමේ කටයුතු නිම කර නොතිබුණි.

(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් 2016 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ කටයුතු සඳහා යොදාගෙන තිබුණි. විගණිත දිනය වන 2023 ජනවාරි 31 දින දක්වාම මෙම වාහන දෙක කොමිෂන් සභාව වෙත පවරාගෙන නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 කාර්ය මණ්ඩල පුරප්පාඩු

2016 පෙබරවාරි 05 දින අංක DMS/1029 ලිපියෙන් කොමිෂන් සභාව වෙත තනතුරු 15 ක් අනුමත කර තිබුණු අතර, 2022 දෙසැම්බර් 31 දිනට ඉන් තනතුරු 05 ක් පුරප්පාඩු පැවතුනි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා 2016 වර්ෂයේ සිට වැඩබැලීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි.

H. S. S. M.

එච්.එස්.එස්.පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
මහරගමුවර්ල

4. කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
1සැලසුම්කරණය හා පුහුණුව			
1.1 වාර්ෂික සැලැස්ම සකස් කිරීම	100%		
1.2 ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම		80%	
1.3 කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම	90%		
1.4 සීමා නිර්ණය ගැටලු පිළිබඳ දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාකච්ඡා පැවැත්වීම			50%
2තොරතුරු එක් රැස් කිරීම			
2.1 තොරතුරු /ගැසට් එක් රැස් කිරීම- පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා) වල මායිම්	100%		
2.2 තොරතුරු /ගැසට් එක් රැස් කිරීම- පරිපාලන කොට්ඨාස මායිම් (පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරී කොට්ඨාස)	95%		
3 ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා ඉඩකඩම් පිළිබඳ ප්‍රමුඛතා පෙරදැරිකොට පසුගිය පාර්ලිමේන්තු ඡන්ද විමසීම් හා බැඳි සීමා නිර්ණය වාර්තා විශ්ලේෂණය කිරීම			
3.1 1946; 1959; 1976; 1981; 1988. පාර්ලිමේන්තු ඡන්ද විමසීම් විශ්ලේෂණය			60%
3.2 වර්තමාන මැතිවරණ කොට්ඨාස මායිම් අධ්‍යයනය කිරීම හා යෝජිත මැතිවරණ කොට්ඨාස සමග ගලපා බැලීම			60%
3.3 පළාත් සභා ඡන්ද කොට්ඨාස මායිම් අධ්‍යයනය කිරීම	100%		
4 පරිපාලන කොට්ඨාස වල සීමා පිළිබඳව අධ්‍යයනය			
4.1 පළාත් හා දිස්ත්‍රික්ක සීමා නිර්ණයන් අධ්‍යයනය කිරීම	90%		
4.2 වර්තමාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අධ්‍යයනය කිරීම	90%		
4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම් අධ්‍යයනය හා නැවත සීමා නියම කිරීම් යෝජනා කිරීම		75%	
5 පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීම පිළිබඳ අධ්‍යයනය			
5.1 ප්‍රාදේශීය සභා සීමා අධ්‍යයනය	100%		
5.2 මහ නගර සභා සීමා අධ්‍යයනය.	100%		
5.3 නගර සභා සීමා අධ්‍යයනය	100%		
6වර්තමානයට ගැළපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම හා ලේඛනවල මෘදුකාංග පිටපත් සකස් කිරීම		75%	

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
-	-	-	-	-	-

5.2තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කොමිෂන් සභාව වෙත කාර්ය භාරයන් පවරා නොමැති වීම මත නිශ්චිතව තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම දුෂ්කර විය. එසේ වුවද කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර අනුව හඳුනා ගන්නා ලද ශ්‍රී ලාංකික ජන සමාජය වෙත, සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා සහ ජාතික සංවර්දන කටයුතු සඳහා දිවයිනේ පළාත් පාලන ආයතන වල මායිම් (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා), පරිපාලන කොට්ඨාස සීමා (පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරී කොට්ඨාස) සහ අධ්‍යාපන, පොලිස්, අධිකරණ, සෞඛ්‍ය, ගොවිජන ආදී බල ප්‍රදේශවල සීමා ඒක මිතිකව සිදු කිරීම සඳහා අවශ්‍ය දත්ත එක් රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම මඟින් තිරසාර සංවර්ධන අරමුණු කරා ගමන් කිරීම උදෙසා සිය සම්පත් මෙහෙයවීම සිදු කර ඇත.

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්ය භාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 දරන ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

තනතුර	මට්ටම	තනතුරු සංඛ්‍යාව	වැටුප් කේතය
ලේකම්	ජ්‍යෙෂ්ඨ	01	SL-3-2006
ගණකාධිකාරි	ජ්‍යෙෂ්ඨ	01	SL-1-2006
සම්බන්ධීකරණ ලේකම්	තෘතියික	01	රා.පරි.ව. 6/2006
පරිපාලන නිලධාරි	තෘතියික	01	MN-7-2006
භාෂා පරිවර්තක	ද්විතියික	03	MN-6-2006
තොරතුරු තාක්ෂණ සහකාර	ද්විතියික	02	MT-1-2006
රාජ්‍ය කළමනාකරණ සහකාර	ද්විතියික	02	MN-2-2006
රියදුරු	ප්‍රාථමික	02	PL-3-2006
කාර්යාල සහයක	ප්‍රාථමික	02	PL-1-2006
එකතුව		15	

මෙම වර්ෂය තුළ පහත සඳහන් පත්වීම් සිදුකර ඇත.

- රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන) අනුර මුතුමාල මහතා කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම් ලෙස 2022.03.21 දින දක්වා කටයුතු කළ අතර, 2022 මාර්තු 22 දින සිට වැඩ බලන ලේකම්වරයා වශයෙන් වසරක කාලයක් සඳහා නැවත පත් කර ගන්නා ලදී.
- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක එස්.ටී.බුලත්සිංහල මහතා 2022.04.30 දින දක්වා වැඩ බලන ගණකාධිකාරී වශයෙන් කටයුතු කළ අතර, 2022.07.01 දින සිට වසරක කාලයක් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී/ ඊ.ජී.එස්. සිසිර කුමාර මහතා වැඩ බලන ගණකාධිකාරි ලෙස පත් කර ඇත.
- සභාපතිගේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ 1 පන්තියේ කළමනාකරණ සේවා නිලධාරි ඒ.එම්.පී.යූ.ද සිල්වා මහතා 2022.06.01 දින සිට පත්කර ගන්නා ලදී.

මේ අනුව 2022.12.31 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

තනතුර	මට්ටම	අනුමත	පුරවන ලද	පුරප්පාඩු
ලේකම්	ජ්‍යෙෂ්ඨ	01	01[a]	-
ගණකාධිකාරි	ජ්‍යෙෂ්ඨ	01	01[a]	-
සම්බන්ධීකරණ ලේකම්	තෘතියික	01	01	-
පරිපාලන නිලධාරි	තෘතියික	01	01	-
භාෂා පරිවර්තක	ද්විතියික	03	0	03
තොරතුරු තාක්ෂණ සහකාර	ද්විතියික	02	0	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	ද්විතියික	02	02	-
රියදුරු	ප්‍රාථමික	02	02	-
කාර්යාල කාර්ය සහයක	ප්‍රාථමික	02	02	-
එකතුව		15	10	05

a - වැඩ බලන

6.2 මානව සම්පත් හිඟය කාර්ය සාධනයට සිදුකරන බලපෑම

1. සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කිරීම හා එහි ප්‍රධාන කාර්ය නියමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථාවන් මඟින් සිදු කෙරේ. එසේ වුවත් සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් වන කාර්යභාරය (Functions) හෝ බලතල (Powers) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ දහනව වන සංශෝධනයේ සඳහන් නොවේ.

2. තවද වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සීමා නිර්ණය කොමිෂන් සභාවට වගකීම් පැවරීමක් (Mandate) සිදුකොට ද නොමැත. එසේ වුවත්, ජාතික සීමා නිර්ණය සැලැස්මක් සකස් කිරීමේ වගකීම ගරු ජනාධිපතිතුමා විසින් පවරා තිබේ. සීමා නිර්ණය කොමිෂන් සභාවේ කටයුතු සඳහා පවත්නා සේවක සංඛ්‍යාව දැනට ප්‍රමාණවත් අතර ආයතනයේ කාර්ය සාධනය සඳහා පවත්නා සේවක පුරප්පාඩු මගින් බරපතල බලපෑමක් සිදු නොවේ.

3. ද්විභාෂා දැනුම සහිත නිලධරයෙකුගේ සේවයේ අවශ්‍යතාව හේතුවෙන් පුරප්පාඩුව පවතින භාෂා පරිවර්තන තනතුරු 3න් එකක් යටපත් කොට, කළමනාකරන සේවා නිලධාරී තනතුරක් ඇති කර ඒ සඳහා ද්වි භාෂා දැනුමැති නිලධරයෙකු බඳවා ගත යුතුව තිබේ.

4. කෙසේ වුවද 2022 නොවැම්බර් සිට සීමා නිර්ණය කිරීමේ ජාතික කමිටුවේ රාජකාරී ඉටු කිරීමේ දී කළමනාකරණ සේවා නිලධරයෙකුගේ හිඟය හා භාෂා පරිවර්තකයෙකු නොමැති වීම බරපතල ගැටළුවක් විය.

6.3 මානව සම්පත් සංවර්ධනය

2022 මාර්තු මස සිට පැවති ආර්ථික අර්බුදයේ බලපෑම නිසා රජයේ කාර්යාලවල ක්‍රියාකාරිත්වය අඩාල වීම හේතුවෙන් හා 2022 නොවැම්බර් සිට සීමා නිර්ණය ජාතික කමිටුවේ කාර්යයන් පැවරුන හෙයින්, යෝජිත පුහුණු වැඩ සටහන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම අපහසු වූ නමුත්, පහත සඳහන් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. **කාර්යාල නිලධාරීන්ගේ මූලික දෙමළ භාෂා දැනුම දියුණු කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම. දෙමළ අකුරු හඳුනා ගැනීම, ගණන් කිරීම, සරල වචන ඉගෙනීම, සරල වාක්‍ය තේරුම් ගැනීම.**
2. **සමාජ ජාල පරිහරනය හා ආයතන සංග්‍රහවේ විධිවිධාන පිළිබඳව දැනුම්වත් කිරීම.**
3. **තොරතුරු දැන ගැනීමේ අයිතිය හා එම පනත පිළිබඳව දැනුම්වත් කිරීම.**
4. **තැපෑල පිළිබඳව, කාර්යාල ක්‍රම පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම.**
5. **සීමා නිර්ණය සඳහා අදාළ කර ගත යුතු, නිර්නායක, කොට්ඨාස මායිම් නිසි ලෙස හඳුනා ගැනීම,සිතියම් හඳුනා ගැනීම යනාදී සීමා නිර්ණයක මූලික කරුණු පිළිබඳ දැනුම යාවත්කිලීන කිරීම.**
6. **සාකච්ඡාමය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කරුණු පිළිබඳව දැනුම්වත් කිරීම.**

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූලනොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	-	-
1.6	වෙනත්	අදාල නොවේ	-	

2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රා.ප.ව.267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාල නොවේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	වෙක්පත් හා මුදල් ඇණුවුම් ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අදාල නොවේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

3	**මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර කිරීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ	-	-

6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අදාල නොවේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තළ දී පිළිතුරු සපයා තිබීම	අදාල නොවේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අදාල නොවේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අදාල නොවේ	-	-

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අදාල නොවේ	-	-

8	**වත්කම් කළමනාකරණ**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රා.මු.ව. අංක5/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අදාල නොවේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 සහ 110 ප්‍රකාරව,කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රා.ප.ව. 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අදාල නොවේ	-	-

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නිමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට ඒම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලැඹීම	අනුකූල වේ	-	-

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අදාල නොවේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අදාල නොවේ	-	-

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාල නොවේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කැ පවත්වාගෙන යාම.	අදාල නොවේ	-	-

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාර පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අදාල නොවේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අදාල නොවේ	-	-
15.3	මු.රෙ. 176 අනුව භිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාල නොවේ	-	-

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ වකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල නොවේ	වෙබ් අඩවියක් නැත.	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම.	අනුකූල නොවේ	වාර්තාව පල කිරීමට වෙබ් අඩවියක් සකසා නොතිබිනි.	-

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රා.ප.ව. අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාල නොවේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී පඥප්තිය සම්පාදය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අදාල නොවේ	-	-

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රා.ප.ව.අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලසැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	අප ආයතනය පුහුණු වැඩසටහන් සම්පාදනය නොකරන අතර බාහිර ආයතන මඟින් සුදුසු අවස්ථා ලබා ගනී.	සුදුසු පරිදි වැඩසටහන් කරා යොමු කිරීම.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන සැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර කොට තිබීම.	අනුකූල වේ	-	-

20	**විගණන ඡෙද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-

8. කෘතඥතා

1. සීමා නිර්ණය කොමිෂන් සභාවට සෑම විටම සහය වූ පාර්ලිමේන්තු සභාවේ සභාපතිවරයාට හා සාමාජිකයන්ට ද
2. සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්යාලය සඳහා ස්ථිර ස්ථානයක් හා ඊට අවශ්‍ය සියලු පහසුකම් සලසා දුන් මිනුම්පතිවරයාට හා ඔහුගේ කාර්ය මණ්ඩලයටද
3. කාර්ය මණ්ඩලය නිදහස් කර දීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීමෙහිලා අවශ්‍ය පහසුකම්සැපයූ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා සෙසු සාමාජිකයන්ට ද එහි අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට ද
4. අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා වාහන සපයා දුන් ජනාධිපති කාර්යාලයට හා මහා භාණ්ඩාගාරයට ද
5. නොයෙකුත් ආකාරයෙන් සහය වූ සියලුම දෙනාටද

අපගේ අවංක ස්තූතිය පළ කර සිටිමු.